# වැලිගම නගර සභාව

## 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

2026 වර්ෂය සඳහා වැලිගම නගර සභාවට අවශ්‍ය භාණ්ඩ,වැඩ හා සේවා සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් හා සේවා සම්පාදකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.12.31 දිනට පෙර කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතු අතර ලියාපදිංචි වීම www.weligamauc.lk යන වැලිගම නගර සභා වෙබ් අඩවියට පිවිසීමෙන් සිදු කිරීමේ හැකියාව ද ඇත.

**1. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA)" ලියාපදිංචි වී ඇත්නම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**2. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.**

සුදුසුකම්:-

I. 2026 වර්ෂය සඳහා වැලිගම නගර සභාවට ද්‍රව්‍ය, උපකරණ, සැපයුම් හා සේවාවන් සැපයීම සඳහා ව්‍යාපාර පවත්වාගෙන යන සැපයුම්කරුවන්ට ඒ සඳහා ලියාපදිංචි විය හැකි අතර ව්‍යාපාරය ලියාපදිංචි කර තිබිය යුතුය. (අයදුම්පත්‍රය සමග ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

II. ඔබගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු විශේෂ බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් වේ නම් එම බලපත්‍රය, අවසර පත්‍රය හො ලියාපදිංචි සහතිකය අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

III.සැපයුම් හා සේවා ඇණවුම් සැපයීමට අවශ්‍ය මූල්‍යමය හා අනෙකුත් හැකියාවන් ඇති බවට ලිඛිත සාක්ෂි සැපයිය යුතුය.

IV.වැට් බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇත්නම් ඊට අදාළ ලියකියවිලිවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**www.weligamauc.lk යන වැලිගම නගර සභා වෙබ් අඩවිය ඔස්සේ ලියාපදිංචි වන්නේ නම් ඉහත අදාළ ලේඛන/ සහතික ස්කෑන් (Scan) කර උඩුගත (Upload) කළ යුතුය.**

**3. අයදුම්කිරීම හා ලියාපදිංචි කිරීම.**

i. අප විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය පමණක් නිසි පරිදි සකස් කර 2025.12.31 දිනට පෙර භාරදිය යුතුය. එක් ව්‍යාපාරයක්/ ආයතනයක් සඳහා එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතු අතර **එක් අයදුම්පත්‍රයක් මගින් අයිතම ඕනෑම ප්‍රමාණයක් ඉදිරිපත් කළ හැකිය.**එක් අයිතමයක් සඳහා ලියාපදිංචි ගාස්තු රු.500/-ක් බැගින් ගෙවිය යුතු අතර කාර්යාලයේ සරප් වෙත හෝ ''සභාපති, වැලිගම නගර සභාව" නමින් ලියන ලද චෙක්පතක් අයදුම්පත්‍රයට අමුණා එවීමෙන් හෝ මුදල් ඇණවුමකින් ගෙවීම් කරන්නේ නම් ලබාගන්නා "සභාපති, වැලිගම නගර සභාව" සහ ගෙවන කාර්යාලය "වැලිගම නගර සභාව" යන්න සඳහන් කර එවීමෙන් ගෙවීම් කළ හැකිය.

ii. www.weligamauc.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් 2026 සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය පිළිබඳ අයදුම්කරුවන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හා අයදුම්පත්‍රය භාගත කරගැනීමට හැකිය.

iii.අයදුම්පත්‍ර හා මුදල් ගෙවීම පිළිබඳ විස්තර (කුවිතාන්සිය, චෙක්පත හෝ මුදල් ඇණවුම), 2025.12.31 දින ප.ව.3.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **සභාපති, නගර සභාව,වැලිගම** යන ලිපිනයට එවීමට කළ යුතුය.

iv.අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **'' සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම-2026 වර්ෂය සඳහා**''යනුවෙන් සඳහන් කළ යුතුය.

**වෙනත් කොන්දේසි**

01.ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ලංසු/ යෝජනා මිල ගණන් කැඳවීම, ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කරනු ලබන අතර වැලිගම නගර සභාවේ අවශ්‍යතාවය අනුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු/ යෝජනා මිල ගණන් කැඳවීමේ අයිතිය වැලිගම නගර සභාවේ සභාපති සතුවේ.

02.ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත්‍රය සළකා බලා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වෙත ඇති හැකියාවන් සහ සුදුසුකම් මත පමණක් එකී අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය හා හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය වැලිගම නගර සභාවේ සභාපති සතුවේ.

03.යම් සැපයුම්කරුවෙකුගේ /කොන්ත්‍රාත්කරුවෙකුගේ භාණ්ඩ,වැඩ හෝ සේවා සැලයිම පිළිගත නොහැකි මට්ටමට දුර්වල තත්ත්වයක පවතින්නේ නම් හෝ සැපයුම්/ කොන්ත්‍රාත් කටයුතු කිරීමේ දී යම් වංචාසහගත ක්‍රියාවක් හෝ අක්‍රමිකතාවයක යෙදුන බවට තහවුරු වුවහොත් එම ආයතන අසාධු ලේඛනයට ඇතුළත්කොට මින් ඉදිරියට සැපයුම්කරුවෙකු/ කොන්ත්‍රාත්කරුවෙකු ලෙස පිළි නොගැනිමට කටයුතු කළ හැකිය.ඒ පිළිබඳව වූ පූර්ණ අයිතිය වැලිගම නගර සභාවේ සභාපති සතු වන්නේය.

04.සියලුම අයදුම්කරුවන් සුදුසුකම්, හැකියාවන් හා යෝග්‍යතාවයන් සපුරා ඇතැයි යන උපකල්පනය මත ලියාපදිංචිය සිදු කරනු ලබන අතර එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලියන්හි දී සුදුසුකම් සපුරා නොමැති සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් වෙතොත්,041-2250275 දුරකථන අංකය ඔස්සේ ගිණුම් අංශයට ඇමතීමෙන් විස්තර ලබාගත හැකිය.

සභාපති,
වැලිගම නගර සභාව.
2025.10.....